**2024-10-07 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **ශ්‍රී ලංකාව හා රුසියාව අතර රේගු කටයුතු සම්බන්ධිත සහයෝගිතාවය හා අන්‍යෝන්‍ය පරිපාලන සහාය ලබා ගැනීම පිළිබඳ ගිවිසුම**

ශ්‍රී ලංකා රජය සහ රුසියානු රජය අතර පැවැති ද්විපාර්ශ්වීය සාකච්ඡා මාලාවකින් අනතුරුව පාරදෘශ්‍ය හා පුරෝකථනය කළ හැකි රේගු ක්‍රියාපටිපාටියක් ඔස්සේ නෛතික වෙළෙඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම පිණිස ද්විපාර්ශ්වික ගිවිසුමක් අත්සන් තැබීමට 2021-11-15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත්, එම ගිවිසුමට මෙතෙක් අත්සන් තබා නොමැත. දෙරට අතර පවතින වෙළෙඳ සබඳතා තුළින් හිමි වන ප්‍රතිලාභ හා ද්විපාර්ශ්වික රේගු සහයෝගිතාවේ නැගී එන ප්‍රවණතා සැලකිල්ලට ගෙන, එකී ගිවිසුමට අත්සන් තැබීම පිණිස මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 57 වැනි සැසි වාරය**

2024-09-09 දින සිට 2024-10-11 දින දක්වා ජිනිවා නුවර පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 57 වැනි සැසි වාරයට අදාළව විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී:

* එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ වත්මන් සැසියේදී යෝජිත යෝජනා කෙටුම්පත ශ්‍රී ලංකාව කරයේ ප්‍රතික්ෂේප කරන බව සහ මානව හිමිකම් කවුන්සිලයේ 51/1 යෝජනාවට ශ්‍රී ලංකාව දිගින් දිගටම විරුද්ධ වන අතරම බාහිර සාක්ෂි එකතු කිරීමේ යාන්ත්‍රණයේ බලතල දීර්ඝ කරන කිසිදු යෝජනාවකට එකඟ නොවන බව.

* එම යෝජනාව ප්‍රතික්ෂේප කරනු ලැබුවද, දේශීය ක්‍රියාවලින් තුළින් සංහිඳියාව ඇතුළු ප්‍රධාන මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව තරයේ අදිටන් කොට ඇති බව.

* ශ්‍රී ලංකාව මානව හිමිකම් කවුන්සිලය සහ නිත්‍ය මානව හිමිකම් යාන්ත්‍රණයන් සමඟ සහයෝගිතාවයෙන් සහ අර්ථකාරී කතිකාවතකින් යුතුව කටයුතු කරනු ලබන බව.

03. **දේශගුණික විපර්යාසවල තීව්‍ර වන බලපෑම් මඟින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වන කලාපීය ව්‍යාපෘතිය**

පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන සමඟ එක්ව දේශගුණික විපර්යාසවල තීව්‍ර වන බලපෑම් මඟින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වන කලාපීය ව්‍යාපෘතියක් සඳහා වන යෝජනාවක් අනුහුරුවීමේ අරමුදල වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුහුරුවීමේ අරමුදල් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ. යෝජිත ව්‍යාපෘතිය වසර 05ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 13ක පමණ මූල්‍ය ප්‍රදානයක් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව වෙත ලබා දෙනු ඇත. ශ්‍රී ලංකාවේ මොනරාගල, ත්‍රිකුණාමලය, මන්නාරම, මුලතිව්, වවුනියාව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකාව සහ ලෝක ආහාර වැඩසටහන අතර අත්සන් තැබීම පිණිස පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (MBSL) සමාගම සඳහා මූලික බැංකුකරණ විසඳුම (Core Banking Solution) සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම සහ නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනය පිරිනැමීම**

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සඳහා මූලික බැංකුකරණ විසඳුම (Core Banking Solution) සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම සහ නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ජාතික

තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ආයතන 04ක් ලංසු ඉදිරිපත් කර තිබේ. ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබ තිබූ තාක්ෂණික යෝජනා සහ මූල්‍ය යෝජනා ඇගයීමෙන් අනතුරුව, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ ප්‍රසම්පාදනය Scienter Technologies (PTE) Ltd වෙත ප්‍රදානය කිරීම නිර්දේශ කර ඇත. ඒ අනුව, එකී ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම පිණිස මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

05. **ඉතාලියේ මිලාන්හි 2024-10-09 දින සිට 11 දින දක්වා පැවැත්වෙන TTG - 2024 සංචාරක ප්‍රදර්ශන භූමියේ ශ්‍රී ලංකාව නියෝජනය කෙරෙන ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම**

2024-10-09 දින සිට 11 දින දක්වා ඉතාලියේ මිලාන්හි පැවැත්වීමට නියමිත TTG - 2024 සංචාරක ප්‍රදර්ශනය සඳහා සංචාරක කර්මාන්තයේ නියුතු සංචාරක නියෝජිතයින් සහ හෝටල් හිමියන් 25 දෙනෙකු සහභාගී වීමට නියමිතව ඇත. ඒ අනුව, ඔවුන් සඳහා පහසුකම් සැපයීම පිණිස ප්‍රදර්ශන භූමියේ වර්ග මීටර 100ක ප්‍රමාණයක් වෙන් කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් කටයුතු කර ඇත. එම කාර්යාංශය විසින් ප්‍රදර්ශන කුටි ඉදිකිරීම සඳහා සීමිත ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ මිල ගණන් කැඳවා ඇති නමුත්, කිසිදු ලංසුවක් ඉදිරිපත් වී නොමැත. ඒ අනුව, පවතින සීමිත කාලය සැලකිල්ලට ගෙන උත්සව සංවිධායකයන්ගේ නිල ඉදිකිරීම් සමාගම වන Prostand S.r.l වෙතින් අදාළ සේවාවන් සපයා ගැනීමට කටයුතු කරනු ලැබ ඇති බව සඳහන් කරමින් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කරුණු සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

06. **ජපාන ණය පහසුකම් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී අංකිත කිරීමේ ව්‍යාපෘතිය (Digital Terrestrial Television Broadcasting)**

ගෝලීය ප්‍රවණතා සමඟ අනුකූල වෙමින් ශ්‍රී ලාංකීය රූපවාහිනී විකාශය දැනට පවතින ප්‍රතිසම (Analog) තාක්ෂණය වෙනුවට අංකිත (Digital) තාක්ෂණය සහිත විකාශයක් ලෙස පරිවර්තනය කිරීම සඳහා 2009

වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. විවිධ හේතූන් මත එම කටයුතු ක්‍රියාත්මක වීම ප්‍රමාද වී ඇති අතර ජපන් ISDB-T තාක්ෂණය යටතේ දේශීය රූපවාහිනී විකාශය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2022-07-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් සලසා දීම පිණිස මේ වන විට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් එකඟතාව පළ කර ඇති බැවින් ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීමට හැකියාව ලැබී තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට වඩාත් ප්‍රතිලාභ හිමිවන ආකාරයට භෞමික රූපවාහිනී අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා වර්තමාන අවශ්‍යතා සහ තාක්ෂණික කරුණු අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිරීක්ෂණ සහ නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් සහ අනෙකුත් අදාළ ආයතනවල නියෝජනයන්ගෙන් සමන්විතව විශේෂ කමිටුවක් පත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සිදු කරන ලද පත්වීම් අවලංගු කිරීම

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ජනාධිපති කාර්යාලය යටතේ "විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කටයුතු සඳහා වන කාර්යාලය" හා "සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් ජන සභා ක්‍රමය ස්ථාපිත කිරීම උදෙසා වන ජාතික ජන සභා ලේකම් කාර්යාලය" ස්ථාපිත කිරීමට සහ "කෘෂිකර්ම නවීකරණ වැඩසටහන" ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබ ඇති අතර, ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන්/උපදේශකයින් පත් කරනු ලැබ ඇත. එම කාර්යාල සහ වැඩසටහන මඟින් අපේක්ෂිත කාර්යයන් අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතින බැවින්, ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබ ඇති නිලධාරීන්ගේ/උපදේශකයින්ගේ සේවය 2024-09-30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කිරීම පිණිස පියවර ගෙන ඇති බව ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

08. **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සේවය දීර්ඝ කිරීම**

2023-09-14 දින සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට එයාර් වයිස් මාර්ෂල් ආර්.එස්.බියන්විල මහතා පත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම පත්වීමේ කාලසීමාව 2024-09-13 දිනෙන් අවසන් වී තිබේ. එබැවින්, ඒ මහතා 2024-12-31 දින දක්වා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ තවදුරටත් සේවයේ යෙදවීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

09. **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කිරීම**

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුර 2024-09-24 දින සිට පුරප්පාඩුවී ඇත. ඒ අනුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වශයෙන් දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි එම්.එස්.පී.සූරියප්පෙරුම මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත් කිරීම පිණිස මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධානතම ආදායම් එකතු කරන ආයතනයක් වන අතර, එහි කාර්යක්ෂමතාව සහ යහපාලනය සෘජු ලෙසම රාජ්‍ය ආදායම කෙරෙහි බලපෑම් ඇති කරයි. එම දෙපාර්තමේන්තුවේ ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය නොවෙනස්ව පවත්වා ගනිමින් ඉදිරි අභියෝග සහ අරමුණු සාක්ෂාත් කර ගත හැකි නායකත්වයක් එකී දෙපාර්තමේන්තුවට ලබා දිය යුතුව ඇත. ඒ අනුව, දැනට සුරාබදු කොමසාරිස් ජනරාල් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන ජේ.එම්.ගුණසිරි මහතාගේ සේවය වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කිරීමටත්, ජනාධිපති කාර්යාලයේ ජනාධිපති අතිරේක

ලේකම් (ආයතන සම්බන්ධීකරණ II) වශයෙන් දැනට සේවය කරනු ලබන දේශීය ආදායම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී යූ.ඩී.එන්.ජයවීර මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත් කිරීමටත් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********